# බළන්ගොඩ නගර සභාව

## 2018-09-13 දින මහ සභා වාර්තාව

**ස්ථානය** - **බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය** - **2018.09.13**

**වේලාව** - **පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | ගරු සභාපති | චමික ජයමිණි විමලසේන මැතිතුමා |
| 2. | ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. | ගරු නාගරික මන්ත්‍රී | අකිල එල්ලාවළ මැතිතුමා |
| 4. | ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. ඩබ්. පී. ගුණරත්න මැතිතුමා |
| 5. | ගරු නාගරික මන්ත්‍රී | ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා |
| 6. | ගරු නාගරික මන්ත්‍රී | එම්. නිමල් කරුණාරත්න මැතිතුමා |
| 7. | ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. ඒ. නදීෂාන් ප්‍රදීප් ජයසේන මැතිතුමා |
| 8. | ගරු නාගරික මන්ත්‍රිනී | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |
| 9. | ගරු නාගරික මන්ත්‍රී | එම්. එස්. පී. ගලප්පත්ති මැතිතුමා |
| 10. | ගරු නාගරික මන්ත්‍රී | එම්. ඩබ්. විමලසිරි මැතිතුමා |
| 11. | ගරු නාගරික මන්ත්‍රී | එම්. එම්. රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 12. | ගරු නාගරික මන්ත්‍රිනී | පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය |
| 13. | ගරු නාගරික මන්ත්‍රිනී | එම්. එස්. ඩී. වීරසිංහ මැතිතුමිය |
| 14. | ගරු නාගරික මන්ත්‍රිනී | එම්. ශාන්තිලේඛා මැතිතුමිය |
| 15. | ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරී සහභාගීත්වය**

| | | |
|---|---|---|
| 1. | ලේකම් | එස්.එච්.ඒ.කරුණාරත්න මිය |

**01. පසුගිය සභාවේ සභා වාර්තාව සම්මත කිරීම**

සභාපතිතුමා විසින් සභාවට දැනුම්දුන් අවස්ථාවේ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් 2018.08.08 දින පැවති මහ සභාවේ සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සත්‍ය වාර්තාවක් බවට යෝජනා කල අතර ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් එය ස්ථිර කරන ලදුව පසුගිය සභාවේ සභා වාර්තාව සත්‍ය වාර්තාවක් බවට සභා සම්මත විය.

මෙහිදී පසුගිය වාර්තාවේ සංශෝධනයන් ලෙස,

05:03 යටතේ ගරු නාගරික මන්ත්‍රී ඊ. ඒ. ජේ. ප්‍රේමකුමාර මැතිතුමා විසින් පවසා සිටින ලද ගල්පල්ලඅරාව මාර්ගය සංවර්ධනය කිරීම යන්න ගල්පල්ලඅරාව ජල ව්‍යාපෘතිය සංවර්ධනය ලෙස වෙනස් විය යුතු බවත්,

04ඃ02ඃ07 සභා අරමුදල් යොදවා පැතිබැම්ම ඉදිකර දීම. (බී.එම්.ජී.මල්ලිකා ජයවර්ධන) යන යෝජනාව යටතේ,ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් එම පැතිබැම්ම ඉදිකර දීම සඳහා වැයවන මුදල කොපමනද යන්න විමසා සිටි පැනය එයට ඇතුළත් විය යුතු බවත් මෙහිදී එම ගරු නාගරික මන්ත්‍රීවරු දෙපළ විසින් පවසා සිටින ලදී.

**02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන නිවේදන**

**03. සංදේශ/පැමිණිලි/පෙත්සම්/ආයාචනා /ලංසුපත් ඉදිරිපත් කිරීම**

**04. 04. කල් දී ඇති යෝජනා**

***04ඃ02 ගරු සභාපති චමික ජයමිණි විමලසේන මැතිතුමා***

**04ඃ02ඃ01 බලංගොඩ නගර සභාවේ පුරප්පාඩු තනතුරු සඳහා අනියම් පදනමින් සේවකයින් බඳවා ගැනීම.**

බලංගොඩ නගර සභාවේ පුරප්පාඩු තනතුරු සඳහා අනියම් පදනමින් සේවකයින් බඳවා ගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාපතතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරන ලද අතර එම යෝජනාව ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එහිදී ගරු සභාපතිතුමන් විසින් මේ පිළිබඳ පැහැදිලි කරමින් 2018.08.23 දින ප්‍රධාන අමාත්‍යාංශයේ පවත්වන ලද සාකච්ඡාව අනුව දැනට පවතින කනිෂ්ඨ

සේවක තනතුරු (PL වැටුප් කාණ්ඩය) පුරප්පාඩු සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින් සහා තීරණයක් මත නම්කර ගරු ආණ්ඩුකාරතුමිය වෙත නම් ලයිස්තුව ඉදිරිපත් කරන ලෙසත්,ඒ අනුව ඔවුන්ට අනියම් පත්වීමක් ලබාදෙන බවත් එම තනතුරු සඳහා වැටුප් ප්‍රතිපූර්ණය කරන බවත් දැනුම් දී ඇති බැවින් හා ඒ පිළිබඳව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක ACLG 03 හා 2018.08.24 දිනැති ලිපියට අනුවද පළාත් පාලන ආයතනයට අදාල අනුමත කාර්යමණ්ඩලයේ පවත්නා පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හා අත්‍යවශ්‍ය සේවාවන් සඳහා සේවකයින් සේවා ගිවිසුම් මත සේවයේ යොදවා ගැනීම සම්බන්ධ වන ඉල්ලීම් සහා තීරණයන් සහ අදාල සියළු ලියකියවිලි සමඟ යොමු කිරීමට කටයුතු කරන ලෙස දන්වා ඇති බවත් පවසා සිටින ලදී. මෙහිදි ගරු සභාපතිතුමන් විසින් එසේ බඳවාගැනීමට අපේක්ෂිත නාම ලේඛනය හා තනතුරු ගරු සභාවට ඉදිරිපත් කරන ලදී.

- වැඩ ක්ෂේත්‍ර කම්කරු - මුණසිංහ ගෙදර මාලක දිල්ෂාන් රණසිංහ<br>මුනිහින් ගෙදර සාලින්ද දිල්ෂාන් චන්ද්‍රසේන<br>වැවේගෙදර සුසන්ත සුගත්සිරි<br>මඩුවන්වල වහුම්පුරගේ ඉඳුනිල් සමරනායක<br>වික්‍රමසිංහ ආරච්චිලාගේ සචිනි මධුෂිකා
- පුස්තකාල සහායිකා - පින්තේරු මහවඩුගේ තිහානි අමන්තා ප්‍රනාන්දු
- රියදුරු - දිසානායක මුදියන්සෙලාගේ අසේල බණ්ඩාර
- සෞඛ්‍ය කම්කරු - ජම්බුගස්වත්ත මනන්නලාගේ ලාල් ප්‍රේමසිරි

මෙහිදි අදහස් පලකල ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා රැකියා දිම පිළිබඳව තමාගේ කිසි විරෝධයක් නොමැති නමුත්,මුදල් වෙන්කර ගැනීමේ ක්‍රියා පටිපාටියකට හා සම්මුඛ පරීක්ෂන පවත්වා තෝරා ගැනීමේ ක්‍රම වේදයකට අනුව, සිදුකල යුතු බවත් පවසා සිටි අතර මන්ත්‍රීවරුන්ගේ දරුවන්ට රැකියා ලබාදීම පිළිබඳ විරුද්ධ බවත්, බඳවාගැනීම් සඳහා සුදුස්සන් එවන ලෙස පළාත් සභාවෙන් යොමුකරන ලද ලිපියේ පිටපතක් තමා වෙත ලබාදෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවළ මැතිතුමා අදහස් දක්වමින්, තමා ඇතුළු කණ්ඩායම මෙම සම්මුතිවාදි ආණ්ඩුවේ සාමාජිකයන් නොවූවද කිසිවෙකුට රැකියාදීම සම්බන්ධයෙන් කිසිවිටෙක විරුද්ධතාවයක් නොදක්වන බවත්, ඉදිරියෙදි මෙවන් කටයුතු සිදුකරන විට විපක්ෂයේ මන්ත්‍රීවරුන්ටද අවමය 10%ක් වැනි යම් ප්‍රතිශතයක් ලබාදීමට කටයුතු කරන ලෙසත් ඉල්ලා සිටින ලදී. එමෙන්ම ජයන්ති පෙරේරා මිය වැනි පෙර පාසල් පාළිකාවන් අඩු දීමනාවක් යටතේ නගර සභා පෙර පාසල්වල ඉතා දීර්ඝ කාලයක් සිදුකරන ලද සේවය

පිළිබඳ සලකා බලා එයටද සුදුසු සාධාරණය ඉටුකරන ලෙස ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමා පවසා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් අසාධරණ ඉල්ලීම් කිරීමට අකමැති අතර,කිසිවිටෙක කිසිවෙකුගේ දරුවෙක් අසරන කිරීමට අකමැති බවත් කොලේ වහලා ගහන ක්‍රියාකලාපය සිදුනොකරන ලෙසත් ඉල්ලා සිටි අතර අවම දීමනාවක් යටතේ දිගු කලක් සේවයේ නියුතු ජයන්ති පෙරේරා මිය වැනි පෙර පාසල් පාළිකාවන් නගර සභා අනුමත කාර්යය මණ්ඩලයට බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකිරීම ට සාධාරණ වන ලෙසත් ඉල්ලා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා අදහස් දක්වමින් මේ සඳහා විරෝධතාවක් නොමැති අතර ඉදිරියේදි තම පාක්ෂිකයන්ටද මේ සඳහා අවස්ථාවක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. සැමට පොදුවේ මෙම අවස්ථාව ලබාදී ඇති බව ගරු සභාපතිතුමන් විසින් මෙහිදී පවසා සිටින ලදී.

මේ සඳහා විරෝධතා ඉදිරිපත් නොවූ හෙයින් ඉහත බලංගොඩ නගර සභාවේ පුරප්පාඩු තනතුරු සඳහා අනියම් පදනමින් සේවකයින් බඳවා ගැනීම සඳහා වූ යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02ඃ02 මැණික් කඩ,මහජන පොළ කඩ,ගබඩා කාමර,විවෘත භූමි සඳහා වන තක්සේරුව ක්‍රියාත්මක කිරීම.**

මැණික් කඩ,මහජන පොළ කඩ,ගබඩා කාමර,විවෘත භූමි සඳහා වන තක්සේරුව ක්‍රියාත්මක කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා කඩකාමර සඳහා තක්සේරුව වැඩි වීම මෙන්ම පදනමක් නොමැතිව කඩ සඳහා තක්සේරුව අඩුවීමද අනුමත කල නොහැකි බවත්, කලින් තක්සේරුවේදි සිදුවූ අසාධාරණය පිළිබඳව ගරු ආණ්ඩුකාරතුමිය දැනුවත් කර සකසන ලද ලිපියට මෙම තක්සේරුව පිළිබඳවද කරුණු ඇතුළත් කරන ලෙසත් පවසා සිටින ලදී.

මෙහිදී කරුණු ඉදිරිපත් කරමින් ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා ඉහත කඩ අතරින් පිටුපස කඩ කාමර ගබඩා කඩ කාමර වන බවත් වෙළෙඳාමක් සිදු නොවන අතර තක්සේරුව වැඩිවීමක් සිදුවී ඇති බවත් පෙන්වා දෙන ලදී.

ඉහතින් පෙන්වා දෙන ලද කරුණු සලකා බලා ගරු සභාපතිතුමන් විසින් දැනට තක්සේරුව අඩුවී තිබෙන කඩකාමර සඳහා දැනට පවතින කුළී මුදලින් 10%ක ප්‍රතිශතයක් එකතුකර අයකිරීමටත්, දැනට තක්සේරුව වැඩිවී තිබෙන කඩකාමර සඳහා එම තක්සේරුව 2019 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීමටත් එය 2019 ජනවාරි සිට ක්‍රියාත්මක කිරීමටත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:03 2019 වර්ෂය සඳහා මහජන පොළ ටෙන්ඩර් කිරීම.**

2019 වර්ෂය සඳහා මහජන පොළ ටෙන්ඩර් කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ පිළිබඳ අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමා 2019 වර්ෂය සඳහා මහජන පොළ ටෙන්ඩර් කිරීම පිළිබඳ තම කණ්ඩායම එකඟ නොවන බවත්, එමගින් නගර සභාව වෙත ලැබිය හැකි ආදායම අඩුවන බවත් , මේ වන විට පොළ භූමිය තුළ කප්පම් ගැනීම,තර්ජනය කිරීම,ලොරි රථ පොළ භූමියට ඇතුළු කිරීමේදි මුදල් අයකර ගැනීම වැනි විවිධ අක්‍රමිකතා සිදුවන බවට තොරතුරු ලැබෙන බවත් පවසා සිටි අතර එම ක්‍රියා නතර කිරීමට ගරු සභාවේ අවධානය යොමුකරන ලෙස ඉල්ලා සිටින ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා වෙළඳුන්ගෙන් හා ත්‍රී විල් රියදුරන්ගෙන් මුදල් ගැනීම නිසා ඔවුනට සිදුවන අසාධාරණයත් එලෙස ලබාදෙන මුදල් වෙළඳුන් විසින් භාණ්ඩ

සඳහා එකතු කිරීම නිසා වක්‍රාකාරව එම අසාධාරණය පාරිභෝගිකයන්ට බලපාන බවත් පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් භාණ්ඩ කිලෝ ග්‍රෑම් 1ක් සඳහා රු.1.00 ක් අයකර ගැනීමේ ක්‍රමවේදය මත කිලෝ ග්‍රෑම් 200 ට මුදල් ගෙවන වෙළෙඳුන් ගේ කිලෝ ග්‍රෑම් 75 ක් පමණක් අලෙවි වුවහොත් ඉතිරි ප්‍රමාණයට සිදුවන්නේ අසාධාරණයක් බවත්, අහිංසක වෙළෙඳුන් ගසාගෙන කෑමට හෝ පීඩාවට ලක් කිරීමට ඉඩදිය නොහැකි බැවින් පොළේ වෙළෙඳුන් කැඳවා මේ පිළිබඳ සාකච්ඡාවක් සිදුකර කරුණු තේරුම් ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුකරන ලෙසත් පවසා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා අදහස් දක්වමින් 1991 වර්ෂයේ නගරයේ කුණු ගොඩක්ව තිබූ පොළ භූමිය ගොඩනැගීමට වැය වූ කෝටි 4.5ක ආදායම මේවන විටත් උපයා අවසන් බවත්, වෙළෙඳ කුටි සහ අතරමැදියන් වෙනුවෙන් වැයකරන මුදල් භාණ්ඩවලට එකතුවීමෙන් පාරිභෝගිකයන් අපහසුතාවයට ලක්වෙන බවත්,මහජන පොළ ටෙන්ඩර් නොකර සභාව මගින් කර ගෙන යාම මගින් වෙළෙන්දත්,පාරිභෝගිකයාත් යන දෙදෙනාම රැකෙන බවත් පවසා සිටින ලදී.එමෙන්ම වර්තමාන මහජන පොල ටෙන්ඩර්කරු පිළිබඳව කිසිදු පැහැදීමක් නොමැති බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී.වීරසිංහ මැතිතුමා සභාව මගින් මහජන පොළ කටයුතු පවත්වා ගෙන යාම සුදුසු බව පවසා සිටින ලදි.

මෙහිදී අදහස් දැක්වූ ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමා, සභාව මගින් පොළ අධීක්ෂන කටයුතු සිදුකිරීම සඳහා කාන්තා නිළධාරිනියක් යෙදවීම වඩාත් සුදුසු බවත්, කිසිවිටෙක සොරකමට ඉඩලබා නොදිය යුතු බවත්,සභාව මගින් ටික කලක් සිදුකල පසු සංසන්දනාත්දමකව ලාභ අලාභ ගණනය කල හැකි බවත් පවසා සිටින ලදී.මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමාද සිය අදහස් දක්වමින්, මහජන පොළ සම්බන්ධව නිවැරදි සංගණනයක්

සිදුකිරීමෙන් පසු හොරකම් ඇති නොවන පරිදි සභාව මගින් කටයුතු පවත්වා ගෙන යා හැකි බව පෙන්වා දෙන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා අදහස් දක්වමින් මහජන පොළ ටෙන්ඩර් කිරීම පිළිබද තීරණය කිරීම වර්තමාන ටෙන්ඩර්කරු පදනම් කරගෙන සිදුකිරීම වැරදි සහගත බවත්, නිවැරදි අධ්‍යයනයක් සිදු නොකර ඔහුට පහර ගැසීමට වඩා වෙළදුන් සමග සාකච්ඡා කර නිසි අවබෝධයකින් යුතුව මේ පිළිබද ක්‍රියාකිරීම සුදුසු බවත් පවසා සිටින ලදී.

ඉහතින් පෙන්වා දෙන ලද සියළු කරුනු සලකා බලා පොළ වෙළදුන් කැඳවා සාකච්ඡා කර ඔවුන්ගේ අදහස් ලබාගැනීමෙන් අනතුරුව පොළ ටෙන්ඩර් කිරීම හෝ සභා නිළධාරීන් යොදවා සිදු කිරීම පිළිබඳ අවසන් තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02ඃ04 2019 වර්ෂය සඳහා මහජන පොළ ආපනශාලා ටෙන්ඩර් කිරීම.**

බලංගොඩ මහජන පොළ ආපන ශාලාව 2019 වර්ෂය සඳහා බදුදීම සඳහා සුදුසු බදුකරුවෙක් තෝරා ගැනීමට විවෘත ටෙන්ඩර් කැදවීමට අවශ්‍ය වී ඇති බැවින් වර්තමාන මුදල වන රු.5610.00 (වැට් හා එන්.බී.ටී. රහිත මාසික) අවම ලංසුව ලෙස ගෙන ටෙන්ඩර් කැදවීමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මතවිය.

**04ඃ02ඃ05 2019 වර්ෂය සඳහා පොදු වෙළෙඳ සැල මස් කඩ ටෙන්ඩර් කිරීම**

2019 වර්ෂය සඳහා පොදු වෙළෙඳ සැල මස් කඩ ටෙන්ඩර් කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි පී. කේ. එන්. ටී. ඩී. සමරසේකර මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දැක්වූ ගරු සභාපතිතුමන් විසින් පොදු වෙළෙඳසැල අංක 15,16 සහ 17 දරණ මස් කඩකාමරවල බදු අයිතිය මෙම වර්ෂයේ දෙසැම්බර් මස 31 න් අවසන් වන අතර එම කඩ කාමර වාර්ෂික බදු දිම සම්බන්ධයෙන් පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛ අංක 2009/1 හි උපදෙස් අනුව 2019 වර්ෂය සඳහා නව බදුකරුවෙක් තෝරාගෙන බදුදිය යුතුව ඇති බව පවසා සිටි අතර ,

පොදුවෙළෙඳ සැල අංක 15 දරණ එළු මස්කඩය - රු.7450.00

පොදුවෙළෙඳ සැල අංක 16 දරණ හරක් මස්කඩය - රු.144,650.00

පොදුවෙළෙඳ සැල අංක 17 දරණ කුකුල් මස්කඩය - රු.12,120.00

ලෙස වූ වර්තමාන මිල ගණන් අවම ලංසුව සේ සලකා දැන්වීම් ප්‍රසිද්ධ කර ටෙන්ඩර් පටිපාටිය අනුව ඉදිරි කටයුතු කිරීමට සුදුසු බව පවසා සිටින ලදී. මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02ඃ06 2019 වර්ෂය සඳහා පොදු වෙළෙඳ සැල අංක 11,12,14 කඩ කාමර ටෙන්ඩර් කිරීම**

2019 වර්ෂය සඳහා පොදු වෙළෙඳ සැල අංක 11,12,14 කඩ කාමර ටෙන්ඩර් කිරීම සඳහා වර්තමාන මිල ගණන් අවම ලංසුව සේ සලකා දැන්වීම් ප්‍රසිද්ධ කර ටෙන්ඩර් පටිපාටිය අනුව ඉදිරි කටයුතු කිරීමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රි ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04෴02෴07 2019 වර්ෂය සඳහා රථ වාහන නැවතුම් ගාස්තු අයකිරීම ටෙන්ඩර් කිරීම.**

2019 වර්ෂය සඳහා රථ වාහන නැවතුම් ගාස්තු අයකිරීම ටෙන්ඩර් කිරීම සඳහා වර්තමාන මිල ගණන් වන රු.164,000.00 අවම ලංසුව සේ සලකා දැන්වීම් ප්‍රසිද්ධ කර ටෙන්ඩර් පටිපාටිය අනුව ඉදිරි කටයුතු කිරීමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04෴02෴08 2019 වර්ෂය සඳහා පෞද්ගලික බස් ගාල් ගාස්තු අයකිරීම ටෙන්ඩර් කිරීම.**

2019 වර්ෂය සඳහා පෞද්ගලික බස් ගාල් ගාස්තු අයකිරීම ටෙන්ඩර් කිරීම සඳහා වර්තමාන මිල ගණන් වන රු.110,200.00 අවම ලංසුව සේ සලකා දැන්වීම් ප්‍රසිද්ධ කර ටෙන්ඩර් පටිපාටිය අනුව ඉදිරි කටයුතු කිරීමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04෴02෴09 2019 වර්ෂය සඳහා පොදු වැසිකිළි ටෙන්ඩර් කිරීම.**

2019 වර්ෂය සඳහා පෞද්ගලික බස් ගාල් ගාස්තු අයකිරීම ටෙන්ඩර් කිරීම සඳහා වර්තමාන මිල ගණන් වන රු.135,023.33 (වැට් හා එන්.බී.ටී. රහිත මාසික) අවම ලංසුව සේ සලකා දැන්වීම් ප්‍රසිද්ධ කර ටෙන්ඩර් පටිපාටිය අනුව ඉදිරි කටයුතු කිරීමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:10 2019 වර්ෂය සඳහා ප්ලාස්ටික් පොලිතින් ප්‍රතිචක්‍රිකරණ මධ්‍යස්ථාන ටෙන්ඩර් කිරීම.**

2019 වර්ෂය සඳහා ප්ලාස්ටික් පොලිතින් ප්‍රතිචක්‍රිකරණ මධ්‍යස්ථාන ටෙන්ඩර් කිරීම සඳහා වර්තමාන මිල ගණන් වන මධ්‍යස්ථානයේ කුළිය රු.15,000.00 හා යන්ත්‍ර ක්ෂය රු.1500.00 අවම ලංසුව සේ සලකා දැන්වීම් ප්‍රසිද්ධ කර ටෙන්ඩර් පටිපාටිය අනුව ඉදිරි කටයුතු කිරීමට සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:11 2019 වර්ෂය සඳහා වරිපනම් බදු,ව්‍යාපාර බදු,කර්මාන්ත බදු,බලපත්‍ර ගාස්තු,සුනඛ ගාස්තු,කසළ ගාස්තු,ගෝ ඝාතක ආඥා පනතට අනුව කොටු ගාස්තු හා සියළුම සේවා ගාස්තු පැනවීම.**

2019 වර්ෂය සඳහා වරිපනම් බදු,ව්‍යාපාර බදු,කර්මාන්ත බදු,බලපත්‍ර ගාස්තු,සුනඛ ගාස්තු,කසළ ගාස්තු,ගෝ ඝාතක ආඥා පනතට අනුව කොටු ගාස්තු හා සියළුම සේවා ගාස්තු පැනවීම ක්‍රියාත්මක කිරීමේදි 2018 වර්ෂයේ ක්‍රියාත්මක කල බදු අනුප්‍රමාණයම 2019 වර්ෂය සඳහා අයකිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04෴02෴12 බයෝ සිස්ටම් ටෙක්නොලොජී සමාගම වෙත කොම්පෝස්ට් අලෙවිය සඳහා ගිවිසුම්ගත වීම හා ගිවිසුම් කෙටුම්පත අනුමත කිරීම.**

බයෝ සිස්ටම් ටෙක්නොලොජී සමාගම වෙත කොම්පෝස්ට් අලෙවිය සඳහා ගිවිසුම්ගත වීම හා ගිවිසුම් කෙටුම්පත අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජී. චන්ද්‍රලතා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. ඒ අනුව ඉහත ආයතනය සඳහා පළමු වසර තුළ කොම්පොස්ට් කිලෝ 01ක් රු.05 ක මුදලකට හා දෙවන වසර තුළ කොම්පෝස්ට් කිලෝ 01ක් රු.06 ක මුදලකටත් ඉතිරි වසර දෙක සඳහා දෙපාර්ශවය එකඟවන මිලකටද ,වසර 4ක් සඳහා කොම්පොස්ට් පොහොර අලෙවිකිරීම සඳහා ගෙනෙන ලද යෝජනාව හා ගිවිසුම් කෙටුම්පත අනුමත කිරීම සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04෴02෴13 සේවා ගිවිසුම් අළුත් කිරීම (පෙර පාසල් පාලිකා ආර්.මංගලේෂ්වරි)**

බලන්ගොඩ නගර සභාව මගින් පාලනය වන වැවවත්ත පෙර පාසලේ සේවයේ නියුතු පෙර පාසල් පාලිකා ආර්.මංගලේෂ්වරි යන අයගේ සේවා ගිවිසුම අළුත් කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04෴02෴14 පදික කඩ ගිවිසුම් කෙටුම්පත අනුමත කිරීම.**

පදික කඩ ගිවිසුම් කෙටුම්පත අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී අකිළ එල්ලාවල මැතිතුමා විසින් අදහස් දක්වමින් පදික වෙළෙදාමේ සිටින ලද නියම සුදුස්සන් හට ප්‍රමුඛස්ථානය ලබාදී මෙම කටයුතු සිදුකරන ලෙස පවසා සිටි අතර ඒ සඳහා පිළිතුරු ලබාදුන් ගරු සභාපතිතුමා, පදික වෙළදුන් ගෙන්වා සාකච්ඡා කර නියම සුදුස්සන් තෝරා මෙම කඩ ලබාදීමට කටයුතු කර ඇති බවත්, කිසිවෙකුට අසාධාරණයක් කර නොමැති බවත් පවසා සිටින ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02ඃ15 පදික කඩ සඳහා කුළි මුදලක් තීරණය කිරීම.**

පදික කඩ සඳහා කුළි මුදලක් තීරණය කිරීමේදි දිනකට රු.50.00 ක මුදලක් සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02ඃ16 බස් නැවතුම්පොළ සිවිළිම සකස් කිරීම.**

බස් නැවතුම්පොළ සිවිළිම සකස් කිරීම සඳහා සභාවේ අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02ඃ17 වැසිජල කාණු පද්ධතියේ ණය මුදල ගෙවීම.**

**වැසිජල කාණු පද්ධතියේ මුළු ණය මුදල වන රු.18,335,919.71 වූ** මුදල මසකට රු.202,918.84 වූ මාසික වාරික 108 කින් 2018 ඔක්තොම්බර් මස සිට බැංකු ස්ථාවර නියෝගයක් මගින් දේශිය ණය සහ සංවර්ධන අරමුදල වෙත ගෙවීමට ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික

මන්ත්‍රි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථාර කරන ලදී. මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:18 විගණන හා කළමණාකරන කමිටුව පත්කිරීම.**

පළාත් ගිණුම් කාරක සභාවේ උපදෙස් පරිදි **විගණන හා කළමණාකරන කමිටුව** පත්කිරීම පිලිබඳව ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත්කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. එහි නිළධාරින් ලෙස පහත සාමාජිකයන් අනුමත කරගන්නා ලදී.

ගරු සභාපතිතුමා

ලේකම්

ගණකාධිකාරි

ප්‍රධාන කළමණාකරන සහකාර

වැඩ අධිකාරි

ආදායම් පරීක්ෂක

මහජන සෞඛ්‍ය පරීක්ෂක

පුස්තකාලායාධිපති

ආයුර්වේද වෛද්‍ය

අභ්‍යන්තර විගණක

පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ නිළධාරියෙක්

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිළධාරියෙක්

පළාත් භාණ්ඩාගාර නියෝජිතයෙක්

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:19 ලේඛන අපහරණ කමිටුව පත්කිරීම.**

ජාතික ලේඛනාරක්ෂක පනතේ විධි විධානයන්ට අනුව රජයේ කාර්යාලවල වාර්ෂිකව ලේඛන අපහරණය කිරීම සිදුකල යුතු බැවින්,එම කමිටුව පත්කර ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත්කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. එහි නිළධාරින් ලෙස පහත සාමාජිකයන් අනුමත කරගන්නා ලදී.

ගරු සභාපතිතුමා

ගරු උපසභාපතිතුමා

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා

ගරු නාගරික මන්ත්‍රී කේ.පී.පේමදාස මැතිතුමා

අංශ ප්‍රධානීන්

ප්‍රජා සංවර්ධන නිළධාරි

විෂය භාර නිළධාරින්

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02ඃ20 පාසල් සම්පත් කේන්ද්‍රවල නව මිල දර්ශනය අනුමත කිරීම.**

පාසල් සම්පත් කේන්ද්‍රවල නව මිල දර්ශනය අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

04ඃ02ඃ21 **බස්නැවතුම්පොල දැනට පවතින පදික කඩ සඳහා නම් වෙනස් කිරීමේදී රු.50,000/= ක පොදු ගාස්තුවක් අයකිරීම හා ඊට අදාළ ගිවිසුම් කෙටුම්පත අනුමත කිරීම.**

බස්නැවතුම්පොල දැනට පවතින පදික කඩ සඳහා නම් වෙනස් කිරීමේදී රු.50,000/= ක පොදු ගාස්තුවක් අයකිරීම හා ඊට අදාළ ගිවිසුම් කෙටුම්පත අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:22 පුස්තකාල උපදේශන කමිටු රැස්වීමේදී ඉදිරිපත් වූ යෝජනා අනුමත කිරීම.**

පුස්තකාල උපදේශන කමිටු රැස්වීමේදී ඉදිරිපත් වූ යෝජනා අනුමත කිරීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:23 හඳුනාගත නොහැකි දේපළක් වන කොට්ඨාශ අංක 4, රාස්සගල පාර,වරිපනම් අංක 54/38 දේපළෙ හිඟ මුදල් කපා හැරීම.**

හඳුනාගත නොහැකි දේපළක් වන කොට්ඨාශ අංක 4, රාස්සගල පාර,වරිපනම් අංක 54/38 දේපළ සම්බන්ධව තොරතුරක් නොමැති හෙයින් ඊට අදාළ හිඟ මුදල් කපා හැරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රි එම්.ඩබ්.විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

04ඃ02:24 **නගර සභාවට පවරන ලද බුළත්ගම තලාව පාර,අංක 245/11 හි පර්චස් 6.44 ක බිම් ප්‍රමාණය සම්බන්ධයෙන් මතුව ඇති ගැටළුව සම්බන්ධව සාකච්ඡා කර තීරණයක් ගැනීම.**

නගර සභාවට පවරන ලද බුළත්ගම තලාව පාර,අංක 245/11 හි පර්චස් 6.44 ක බිම් ප්‍රමාණය සම්බන්ධයෙන් මතුව ඇති ගැටළුව සම්බන්ධව සාකච්ඡා කිරීමේදි සභාවේ පළ වූ විවිධ අදහස් සළකා එම ඉඩම් කොටස සම්බන්ධ පැටිකිරියක් ලබාගෙන ඉදිරියේදි තීරණයක් ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02ඃ25 තාර මිල ගණන් ඉදිරිපත් කිරීම හා මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාගැනීම.**

තාර මිල ගණන් ඉදිරිපත් කිරීම හා මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබාගැනීමේ යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කල ගරු සභාපතිතුමන්,මේ වන විට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සතුව තොග නොමැති හෙයින් ඊට පසුව අවම මිල ගණන් ඉදිරිපත් කර ඇති බිටුමික්ස් ආයතනය වෙතින් බැරල් 1ක් 14,400.00 බැගින් බැරල් 50ක් මිලදී ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02ඃ26 පුද්ගලික මන්ත්‍රි ප්‍රතිපාදන යොදවා අඩු ආදායම් ලාභීන් තිදෙනෙකු සඳහා එක් අයෙකුට රු.50,000/= බැගින් නිවාස ආධාර ලබාදීම.**

ගරු සභාපතිතුමන්ගේ පුද්ගලික මන්ත්‍රි ප්‍රතිපාදන යොදවා අඩු ආදායම් ලාභීන් තිදෙනෙකු සඳහා එක් අයෙකුට රු.50,000/= ක වටිනාකමෙන් යුතු නිවාස ඉදිකර ගැනීමට අවශ්‍ය ද්‍රව්‍යමය ආධාර ලබාදීමට අපේක්ෂා කරන බවත් ඒ සඳහා අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:27 කුමාරගම විජයානන්ද මහතාගේ සහ ඒ අවට ජනතාවගේ නිවාස සඳහා යන මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම.**

කුමාරගම විජයානන්ද මහතාගේ සහ ඒ අවට ජනතාවගේ නිවාස සඳහා යන මාර්ගය ජේ.සී.බී. යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම සඳහා ජේ.සී.බී. පැය 3 ක් පමණ ගතවන බවත් ඒ සඳහා අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රි රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04:02:28 බස් නැවතුම්පොළ සී 46 කඩකාමරය ටෙන්ඩර් කිරීම.**

බස් නැවතුම්පොළ සී 46 කඩකාමරය ටෙන්ඩර් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමන් විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව ගරු නාගරික මන්ත්‍රි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02:29 නගර සභා ප්‍රධාන ගොඩනැගිල්ලට යාබඳ ඉදිකිරීම සම්බන්ධ අනුමැතිය ගැනීම.**

නගර සභා ප්‍රධාන ගොඩනැගිල්ලට යාබඳ ඉදිකිරීම සම්බන්ධ අනුමැතිය ගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. මෙහිදී
මෙහි නිතිමය තත්වය පිළිබඳ නිළධාරින විසින් පෙන්වා දුන් පසුව ගරු සභාවේ සාකච්ඡා කල කරුණු අනුව කාර්යාලයේ ඉඩපහසුකම් කිසිසේත්ම ප්‍රමානවත් නොවන බැවින් හා මේ සඳහා විකල්ප ස්ථානයක් නොමැති බැවින් ප්‍රධාන ගොඩනැගිල්ලට යාබඳ අදාළ ස්ථානයේම මෙම ඉදිකිරීම සිදු කිරීමට ගරු සභාවේ අනුමත කරගන්නා ලදී.
මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02:30 නගර සභා සිමාව තුළ පවතින සියළුම මාර්ග හා දේපළ පරිගණකගත කිරීමේ වැඩ සටහන අනුමත කිරීම.**

නගර සභා සිමාව තුළ පවතින සියළුම මාර්ග හා දේපළ පරිගණකගත කිරීමේ වැඩ සටහන සඳහා ගරු සභාවේ අනුමැතිය පතමින් ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.
මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**04ඃ02:31 බළන්ගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යෝජිත පොදු වෙළෙඳ සැල ඉදිකිරීමේදි අවශ්‍ය උපදේශන ගාස්තු ගෙවීම**

බළන්ගොඩ නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ යෝජිත පොදු වෙළෙඳ සැල ඉදිකිරීමේදි ගෘහ නිර්මාණාත්මක සැලසුම් සකස් කිරීම,ඉංජිනේරුමය සැලසුම් සකස් කිරීම,ප්‍රමාණ බිල්පත් සැකසීම සහ ව්‍යාපෘති කළමනාකරණය යන සේවාවන් ලබාදීම සඳහා ව්‍යාපෘති

පිරිවැයෙන් 6% ක උපදේශන සේවා ගාස්තුවක් නාගරික සංවර්ධන අධිකාරිය වෙත ලබාදිය යු.තු බැවින් එය අනුමත කරගැනීම සඳහා ගරු සභාපතිතුමන් විසින් ගෙනා යෝජනාව ගරු නාගරික මන්ත්‍රී සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනාව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***ඇස්තමේන්තු අනුමත කරගැනීම***

**04ඃ02ඃ32 බස්නැවතුම්පොළ සිවිලිම සකස් කිරීම.**

බස්නැවතුම්පොළ සිවිලිම ඇස්බැස්ටෝස් යොදා සකස් කිරීම සඳහා වැයවන රු.2,500,000.00 වන ඇස්තමේන්තුව ගරු සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදුව විරෝධතා නොමැති හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

## 05. මන්ත්‍රී යෝජනා

***05ඃ01 ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා***

05ඃ01ඃ01එක් අයෙකුට රු.50,000/= බැගින් 8 දෙනෙකු සඳහා නිවාස ආධාර ලබාදීම.

05ඃ01ඃ02 නිදහස් ආයුර්වේදය අංග සම්පූර්ණ ආයුර්වේදයක් බවට පත් කිරීම.

05ඃ01ඃ03 දනට ලැබෙන මුදල්වලින් නගර සභාව ශීඝ්‍රයෙන් දියුණු කිරීම.

05ඃ01ඃ04 ජේ.සී.බී. යන්ත්‍රය ඇතුළු නගර සභාව සතු සියළුම වාහන පූර්ණ සේවා කිරීම.

ගරු නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. මෙහිදීගරු *නාගරික මන්ත්‍රී නිමල් ගාමිණී වීරසිංහ මැතිතුමා* අදහස් දක්වමින් 8 දෙනෙකු සඳහා එක් අයෙකුට රු.50,000/=බැගින් නිවාස අධාර ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත්, නිදහස් ආයුර්වේදය අංග සම්පූර්ණ ආයුර්වේදයක් බවට පත් කිරීම ඉතා කාලෝචිත හා අත්‍යවශ්‍ය කටයුත්තක් බවත්, ජේ.සී.බී. යන්ත්‍රය ඇතුළු නගර සභාව සතු

සියළුම වාහන පූර්ණ සේවා කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසත් පවසා සිටින ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05ඃ02 ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය***

05ඃ02ඃ01 පෞද්ගලික මන්ත්‍රි ප්‍රතිපාදන යොදවා නිවාස ආධාර ලබාදීම.

05ඃ02ඃ02 කුමාරගම වසමේ කුමාරගම නගර සභා සීමාව තුළ තිබෙන බෝධි මළුව සඳහා විදුලිය ලබාගැනීම.

05ඃ02ඃ03 නීතිඥ්‍ය කාර්යාල සංකීර්ණයේ ඉදිකිරීම් සඳහා බලංගොඩ නගර මධ්‍යයේ පිහිටා ඇති කාර්පාක්හි වාහන ගාල් කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීම සඳහා බලංගොඩ නීතිඥ්‍ය සංගමයේ ලේකම්,සභාපතිවරුන් සඳහා ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට දිනයක් ලබාදීම.

05ඃ02ඃ04 බලංගොඩ මහජන පුස්තකාලය සඳහා පොත් අසුරා තැබීමේ දැව රාක්ක දෙකක් සඳහා සභා මුදල් වෙන්කිරීම.

05ඃ02ඃ05 බලංගොඩ උඩ ඇල්ලෙපොළ,පල්ලෙකුඹුර මාර්ගය සඳහා ප්‍රිමික්ස් යොදා ප්‍රතිසංස්කරණය කිරීම

05ඃ02ඃ06 බලංගොඩ උඩ ඇල්ලෙපොළ පල්ලෙකුඹුර මාර්ගය සඳහා පොදු ජල නළයක් ලබාදීම.

05ඃ02ඃ07 2018 දෙසැම්බර් මස වීරසුන්දරාරාමය විහාරාස්ථානය මගින් පවත්වනු ලබන සංඝමිත්තා පෙරහැර සඳහා සභාගත මුදලින් රු.25,000/= ක් පරිත්‍යාග කිරීම.

ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රි කේ.පී.පේමදාස මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් පලකරන ලද ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් තම පෞද්ගලික මන්ත්‍රි ප්‍රතිපාදන යොදවා නිවාස ආධාර ලබාදීමට අපේක්ෂා කරන බවත්, කුමාරගම වසමේ කුමාරගම නගර සභා සීමාව තුළ තිබෙන බෝධි මළුව සඳහා විදුලිය ලබාගැනීමේ කටයුතු කඩිනම් කරදෙන ලෙසත්, නීතිඥ්‍ය කාර්යාල සංකීර්ණයේ ඉදිකිරීම් සඳහා බලංගොඩ නගර මධ්‍යයේ පිහිටා ඇති කාර්පාක්හි වාහන ගාල්

කිරීමේ ක්‍රමවේදය විධිමත් කිරීම සඳහා බලංගොඩ නීතිඥ සංගමයේ ලේකම්,සභාපතිවරුන් සඳහා ඒ සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට දිනයක් ලබාදෙන ලෙසත්, බලංගොඩ මහජන පුස්තකාලය සඳහා පොත් අසුරා තැබීමේ දැව රාක්ක දෙකක් සඳහා සහා මුදල් වෙන්කිරීමට කටයුතු සලසා දෙන ලෙසත්, බලංගොඩ උඩ ඇල්ලෙපොළ,පල්ලෙකුඹුර මාර්ගය සඳහා ප්‍රිමික්ස් යොදා ප්‍රතිසංස්කරණය කර, පොදු ජල නළයක් ලබාදීමට කටයුතු සලසා දෙන ලෙසත්,2018 දෙසැම්බර් මස වීරසුන්දරාරාමය විහාරාස්ථානය මගින් පවත්වනු ලබන සංඝමිත්තා පෙරහැර සඳහා සභාගත මුදලින් රු.25,000/= ක් පරිත්‍යාග කිරීම පිළිබඳ ගරු සභාවේ අවධානය යොමුකරන ලෙසත් ඉල්ලා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් අදහස් දක්වමින්, කාර්පාක්හි වාහන ගාල් කිරීම සඳහා නීතිඥ මහත්වරුන්ට ඉඩලබා දීමේ යෝජනාව සඳහා තමන් එකහෙළා විරුද්ධ වන බවත්, බොහෝ කාලයක් සිට පැවත ගෙන එන වයස්ගත පරන රියදුරන් පිරිසක් එම ස්ථානයේ රැඳී සිටින බවත්,ඔවුනට හිමි ස්ථානය හා නගරයට පැමිණෙන පාරිභෝගිකයන් හට තම වාහනය ගාල් කර යාමට ඇති මෙම ස්ථානය නීතිඥයන් හට ලබාදීමෙන් සිදුවන අසාධාරණය පිළිබඳ කරුණු පෙන්වා දුන් අතර,නගර සභාව හා බලංගොඩ නීතිඥ සංගමය අතර එවන් සාකච්ඡාවක් ලබාදෙන්නේ නම්, වෙළෙඳ සංගමය හා නාගරික මන්ත්‍රීවරුන් එම සාකච්ඡාව සඳහා කැඳවන ලෙසද ඉල්ලා සිටින ලදී.

ගරු නාගරික මන්ත්‍රිනි එම්.ශාන්තිලේඛා මැතිතුමිය විසින් ඉදිරිපත්කරන ලද යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:03 ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය***

05:03:01 තුඹගොඩ ශ්‍රී සුදර්ශන මහා විහාස්ථානයේ අභිනවයෙන් ඉදිකෙරෙන ලද පුස්තකාලය සඳහා පොත් රාක්ක සඳහා පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු.50,000/= ලබාදීම.

05:03:02 හුණුකුඹුර ගාලවත්ත කේ.එල්.එම්.නිශාන්ත මහතාගේ නිවස අසළ සිට කේ.එල්.එම්.සරත් කුමාරසිරි මහතාගේ නිවස දක්වා මීටර් 70 පමණ මාර්ගයට,කානුව සහිත පාරට කොන්ක්‍රීට් යෙදවීමට ප්‍රතිපාදන වෙන් කිරීම.

05:03:03 පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන යොදවා සෙවිළි තහඩු ලබාදීම.

ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වූ ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන යොදවා සෙවිළි තහඩු ලබාදීමේ යෝජනාව සඳහා නම් 4 කින් යුත් නාම ලේඛනයක් ලබාදී ඇති බවත්, එම යෝජනාව සඳහා ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කරන මෙන් ඉල්ලා සිටි අතර, හුණුකුඹුර ගාලවත්ත කේ.එල්.එම්.නිශාන්ත මහතාගේ නිවස අසළ සිට කේ.එල්.එම්.සරත් කුමාරසිරි මහතාගේ නිවස දක්වා මීටර් 70 පමණ මාර්ගය වැස්ස නිසා සේදී ඛාදනයට ලක් වී ඇති බැවින් කාණුව සමඟ මාර්ගය කොන්ක්‍රීට් කිරීමට ප්‍රතිපාදන වෙන් කර දෙන මෙන් ඉල්ලා සිටින ලදී. එමෙන්ම තුඹගොඩ ශ්‍රී සුදර්ශන මහා විහාස්ථානයේ අභිනවයෙන් ඉදිකෙරෙන ලද පුස්තකාලයේ පොත් රාක්ක සඳහා පෞද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදනවලින් රු.50,000/= ලබාදීමට අවශ්‍ය කටයුතුද කඩිනමින් ලබාදෙන ලෙස ගරු නාගරික මන්ත්‍රී ජී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් මෙහිදී ඉල්ලා සිටින ලදී.
මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:07 ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමා***

05:07:01 බලංගොඩ කල්තොට පාරේ පිහිටි නගර සභාවට අයත් ළිඳ මේවන විට අපවිත්‍ර වී පාවිච්චියට ගතනොහැකි තත්වයක පවතින බැවින් ළිඳ පවිත්‍රකර,ආවරණ බැම්ම අළුත් වැඩියා කර නැවත ජනතාවගේ පරිහරනයට සුදුසු තත්වයකට පත්කිරීම.

05:07:02 බලන්ගොඩ බෝම්බුව විහාරස්ථානයට පහල කොටසේ නගරය දෙසට ඇති කාණුව අබලන් වී වල් බිහි වී ඇති හෙයින් වැසිජලය සහ නිවෙස්වලින් බැහැර කරනු ලබන අපවිත්‍ර ජලය මාර්ගය දිගේ ගලාවිත් ආසන්නතම වෙල්යායට එකතු වන හෙයින් එම කාණු පද්ධතිය හා බෝක්කුව පිළිසකර කිරීම.

05:07:03 කම්කරු විනිශ්චය සභාව රත්නපුරට ගෙන ගොස් ඇති බැවින් දුර බැහැර ජනතාව පීඩාවට පත්ව ඇති හෙයින් එම ආයතනය නැවත බලංගොඩ නගරයේම ස්ථාපිත කරන මෙන් ගරු අධිකරණ ඇමතිතුමියගෙන් ඉල්ලා සිටින යෝජනාවක් සභාවේ සියළු දෙනාගේ එකඟත්වයෙන් ගරු ඇමතිතුමිය වෙත යොමු කිරීම.

ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමන් විසින් ඉදිරිපත්කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් පවසන ලද ගරු නාගරික මන්ත්‍රී කේ.ජී.පේමදාස මැතිතුමන් විසින් සෙල්ලච්චි නාගම්මා නම් කාන්තාවක් විසින් පරිත්‍යාග කරන ලද බලංගොඩ කල්තොට පාරේ පිහිටි නගර සභාවට අයත් ළිඳ මේවන විට අපවිත්‍ර වී පාවිච්චියට ගතනොහැකි තත්වයක පවතින බැවින් ළිඳ පවිත්‍රකර,ආවරණ බැම්ම අළුත් වැඩියා කර නැවත ජනතාවගේ පරිහරනයට සුදුසු තත්වයකට පත්කිරීම තුලින් මේ පිළිබඳ බලාපොරොත්තුවෙන් සිටින නගරයේ වැඩකරන යම් පිරිස් සඳහා ප්‍රයෝජනයට ගත හැකි බවත්, ගින්නක් වැනි හදිසි අවස්ථාවන්හිදී ප්‍රයෝජනයට ගත හැකි බවත් ගරු සභාවට පෙන්වා දෙන ලදී.

එමෙන්ම බලන්ගොඩ බෝම්බුව විහාරස්ථානයට පහල කොටසේ නගරය දෙසට ඇති කාණුව අබලන් වී වල් බිහි වී කාණුව අවහිර වී ඇති හෙයින් වැසිජලය සහ නිවෙස්වලින් බැහැර කරනු ලබන අපවිත්‍ර ජලය මාර්ගය දිගේ ගලාවිත් ආසන්නයේ ඇති වෙල්යායට එකතු වන හෙයින් එම කාණු පද්ධතිය හා බෝක්කුව පිළිසකර කිරීම කෙරෙහි ගරු සභාවේ අවධානය යොමු කරන ලෙසත්, කම්කරු

විනිශ්චය සභාව රත්නපුරට ගෙන ගොස් ඇති බැවින් දුර බැහැර ජනතාව පීඩාවට පත්ව ඇති බවත් එම ආයතනය නැවත බලංගොඩ නගරයේම ස්ථාපිත කරන මෙන් ගරු අධිකරණ ඇමතිතුමියගෙන් ඉල්ලා සිටින යෝජනාවක් සභාවේ සියළු දෙනාගේ එකඟත්වයෙන් ගරු ඇමතිතුමිය වෙත යොමු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරන ලෙසත් ඉල්ලා සිටින ලදී.කුළියට ගන්නා ලද කාමරයක හෝ මෙම ආයතනය පවත්වා ගෙන යා හැකි බවත්,ඉන් එම ජනතාවට සිදුවන පීඩාව , දැරීමට සිදුවන වියදම හා ගතවන කාලය අඩුකර ගත හැකි බවත් මෙහිදී පවසා සිටින ලදී.

ගරු සභාපතිතුමන් විසින් අදහස් දක්වමින් ඉහතින් සඳහන් කරන ලද ළිඳ පසුගිය වකවානුවේ සැළකිය යුතු මුදලක් වැය කර පිළිසකර කරන ලද්දක් බවත් මෙය නැවතත් පිලිසකර කලහොත් ඒ සඳහා ඉල්ලීම් කරන ලද ජනතාවගේ සහභාගීත්වයෙන් කමිටුවක් පිහිටුවා අදාළ නඩත්තු හා පිරිසිදු කිරීම් කරගෙන යාම පිළිබඳ කටයුතු ගරු නාගරික මන්ත්‍රි කේ.ජී.පේමදාස මැතිතුමා සමබන්ධවී කරගෙන යන මෙන් පවසා සිටින ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රි වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් මෙම ළිදේ ජලය අපවිත්‍ර බවට කරුණු සැලවී ඇති බැවින් අදාළ පිළිසකර කිරීම් සිදු කිරීමට පොරොතුව ජල සාම්පල් පරීක්ෂාවක් සිදු කරන ලෙස පවසා සිටින ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

***05:08 ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා***

05:08:01 බස් නැවතුම්පොළ ගොඩනැගිලි සංකීර්ණයට සූර්ය විදුලිබල පද්ධතියක් ස්ථාපනය කිරීම.

05:08:02 නගර සභාව යටතේ පාලනය වන බුළත්ගම පොදු සුසාන භූමිය සඳහා තණකොළ කපන යන්ත්‍රයක් ලබාදීම.

05:08:03 නගර සභාවේ පොදු සුසාන භූමිය බළන්ගොඩ නගර සභාවේ මිහිදන් උයන ලෙස නම් කිරීම.

05:08:04 වැවවත්ත උද්‍යානයේ ඉදිකිරීමට යෝජිත කාණු පද්ධතියේ කොන්ත්‍රාත්තුව බුළත්ගම එක්සත් මිතුරු සංසදයට ලබාදීම.

05ඃ08ඃ05 බුළත්ගම ඇස්ඇද්දුම මාර්ගයට පානීය ජලය ලබාදීම.

05ඃ08ඃ06 වැවවත්ත උද්‍යානයේ මාර්ග පද්ධතිය පෙර නිමි තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම සහ නිතර ජලය එක්රැස් වීම හේතුවෙන් විශාල පාරිසරික ගැටළුවක් උද්ගත වී ඇති ඉන්දික ජයසේකර මහතාගේ නිවස ඉදිරිපිට බෝක්කුව ගලවා එය ක්‍රමවත්ව සෑදීම.

ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රිනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ස්ථිර කරන ලදී. මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රි නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා බස් නැවතුම්පොළ ගොඩනැගිලි සංකීර්ණයට සූර්ය විදුලිබල පද්ධතියක් ස්ථාපනය කිරීම තුළින් , ආරම්භයේදි අධික පිරිවැයක් දැරීමට සිදුවූවද ,දිගුකාලීනව විශාල ඉතිරියක් හා ආයෝජනයක් බැවින් ඒ සඳහා සභාවේ අවධානය යොමුකරන ලෙස පවසා සිටින ලදී. වැවවත්ත උද්‍යානයේ ඉදිකිරීමට යෝජිත කාණු පද්ධතියේ කොන්ත්‍රාත්තුව පෙරදී ලබාදීමට තීරණය කරන ලද ගොවි සමිතිය, හැකියාව ඉක්මවා ගිවිසුම්ගත වීම නිසා එම කොන්ත්‍රාත්තුව බුළත්ගම එක්සත් මිතුරු සංසදයට ලබාදීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසත් පවසා සිටින ලදී.

එමෙන්ම නගර සභාව යටතේ පාලනය වන බුළත්ගම පොදු සුසාන භූමිය සඳහා තණකොළ කපන යන්ත්‍රයක් ලබාදීම තුළින් එම භූමිය අලංකාරව හා ක්‍රමවත්ව පවත්වා ගෙන යා හැකි බවත්, නගර සභාවේ පොදු සුසාන භූමිය බළන්ගොඩ නගර සභාවේ මිහිදන් උයන ලෙස නම් කිරීම හා 'බුළත්ගම ඇස්ඇද්දුම මාර්ගයට පානීය ජලය ලබාදීම සඳහා සභාවේ අවධානය යොමු කරන ලෙසත් ඉල්ලා සිටි ගරු නාගරික මන්ත්‍රී නදීෂාන් වික්‍රමාරච්චි මැතිතුමා වැවවත්ත උද්‍යානයේ මාර්ග පද්ධතිය පෙර නිමි තාර දමා ප්‍රතිසංස්කරණය කිරීම සහ නිතර ජලය එක්රැස් වීම හේතුවෙන් විශාල පාරිසරික ගැටළුවක් උද්ගත වී ඇති ඉන්දික ජයසේකර මහතාගේ නිවස ඉදිරිපිට බෝක්කුව ගලවා එය ක්‍රමවත්ව සෑදීම සඳහාද ගරු සභාවේ කඩිනම් අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටින ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

*05:09 ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ජ්. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා*

05:09:01 2018 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් වෙන් කරන ලද කිවුළවෙළ මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය බලංගොඩ නගර සභාවේ සෘජු ශ්‍රමය මගින් සිදු කිරීමට යෝජනා කිරීම.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ජ්. වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද 2018 වර්ෂයේ මන්ත්‍රී ප්‍රතිපාදනවලින් වෙන් කරන ලද කිවුළවෙළ මාර්ගය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය බලංගොඩ නගර සභාවේ සෘජු ශ්‍රමය මගින් සිදු කිරීමේ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

*05:10 ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය*

05:10:01 ස්වයං රැකියා ව්‍යාපෘතියක් ලෙස කාන්තා බෑග් මැසීමේ ව්‍යාපෘතියක් ආරම්භ කිරීම.

05:10:02 පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන යොදවා අඩු ආදායම් ලාභීන් තිදෙනෙකු සඳහා එක් අයෙකුට රු.35,000/= බැගින් නිවාස ආධාර ලබාදීම.

05:10:03 කරව්කැටිය මාර්ගයේ නිවසකින් පිටකරන අපද්‍රව්‍යය බැහැර කරන නලය ඉවත්කිරීමට කටයුතු කිරීම.

ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමන් විසින් ස්ථිර කරන ලදී.

මෙහිදී අදහස් දක්වන ලද ගරු නාගරික මන්ත්‍රීනි සුනේත්‍රා ඩී වීරසිංහ මැතිතුමිය ස්වයං රැකියා ව්‍යාපෘතියක් ලෙස කාන්තා බෑග් මැසීමේ ව්‍යාපෘතිය ආරම්භ කර සාර්ථකව කර ගෙන යාමට අපේක්ෂා කරන බවත්, පුද්ගලික මන්ත්‍රී ප්‍රතිපාදන යොදවා අඩු ආදායම් ලාභීන් තිදෙනෙකු සඳහා එක් අයෙකුට රු.35,000/= බැගින් නිවාස ආධාර ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් පවසා සිටි අතර කරව්කැටිය මාර්ගයේ නිවසකින් පිටකරන අපද්‍රව්‍යය බැහැර කරන නලය නිසා ගම්වාසීන් විශාල

අපහසුතාවයන්ට ගොදුරු වන බැවින් එම පීඩාව නතර කිරීම සඳහා ගරු සභාවේ මැදිහත් වීම සිදු කරන ලෙසද ඉල්ලා සිටින ලදී.

මේ සඳහා විරෝධතා නොමැති හෙයින් ඉහත යෝජනා ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

**06. කාරක සභා වාර්තා, කමිටු වාර්තා සළකා බැලීම.**

මෙහිදී 2018.07.31/ 2018.08.14/2018.08.29 දින පැවති මුදල් හා කර්මාන්ත කමිටු වාර්තා ගරු සභාවට ඉදිරිපත් කරන ලදුව සභාවේ ඒකමතිකව සම්මත විය.

**07. ආදායම් වියදම් වාර්තා සළකා බැලීම.**

| | |
|---|---|
| **පුනරාවර්ථන ලැබීම්** | **7,853,745.50** |
| **වෙනත් ලැබීම්** | **5,858,195.63** |
| **මුලු ලැබීම්** | **13,711,941.13** |
| **පුනරාවර්ථන වියදම්** | **9,003,099.96** |
| **වෙනත් වියදම්** | **2,723,731.25** |
| **මුලු වියදම්** | **11,726,831.31** |

**ඉන්ධන වාර්තාව සභාවට ඉදිරිපත් කිරිම.**

2018 -08-01 සිට 2018-08-31 දක්වා

| වාහන අංකය | මුළු එකතුව |
|---|---|
| 150-0248 | 1,450.00 |
| 227-5020 | 45,980.00 |
| 37-7933 | 16,220.00 |
| 56-1906 | 28,320.00 |
| BC-0005 | 58,750.00 |
| DDR0008 | 1,770.00 |
| DPP0006 | 7,350.00 |
| FCON0015 | 2,360.00 |

| | |
|---|---:|
| GC 0001 | 8,920.00 |
| GK-6227 | 43,625.00 |
| JD-4684 | 1,450.00 |
| LL-2110 | 24,125.00 |
| LL-7688 | 10,620.00 |
| MIXB001 | 1,450.00 |
| ND-5124 | 46,610.00 |
| PF-4006 | 44,250.00 |
| QL-2901 | 7,975.00 |
| RB-4786 | 26,640.00 |
| RB-4786 | 1,580.00 |
| RC-1118 | 32,440.00 |
| RC-8183 | 47,640.00 |
| RD-8000 | 8,260.00 |
| RD-8240 | 63,220.00 |
| RD-8240 | 700.00 |
| RE-2600 | 17,700.00 |
| ZA-5039 | 68,381.00 |
| **එකතුව** | **616,336.00** |

**08.　　පෞද්ගලික මන්ත්‍රී පැහැදිලි කිරීම්**

**<u>ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා</u>**

- ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් අදහස් දක්වමින් පොළ ටෙන්ඩර් කිරීම සිදුනොකර නගර සභාව මගින් පවත්වාගෙන යාම සුදුසු බවත්,2019 අයවැය යෝජනා සඳහා පෙර පැසල් පාලිකාවන්ගේ දීමනාව වැඩිකිරීමේ යෝජනාව ඇතුළත් කරගන්නා ලෙසත්,සම්මත අතුරු ව්‍යවස්ථාව පිළිබඳව ආදායම් පරීක්ෂකවරුන්ට නිසි දැනුමක් ලබා දී නගර සභා සීමාවේ ඉඩදුන් ප්‍රදේශ හැර අනෙකුත් ස්ථානවල මස් මාළු අලෙවිය තහනම් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත් මහජන පොළ භූමිය අසළ ඇති බුදු මැදුර ඉදිරිපස කුකුල් මස් කඩය එම ස්ථානයෙන් ඉවත් කල යුතු බවත් පවසා සිටින ලදී.

● නගරයේ බොහොමයක් ස්ථානවල වතුර බැස යාම ක්‍රමවත් කලයුතු බවත්, ඒ පිළිබඳව නීත්‍යානුකූල පරිදි කටයුතු නොකරන පිරිස් සඳහා නීතිය ක්‍රියාත්මක කරන ලෙසත් ,නගරයේ වෙළෙඳ සැල්වල කෑලි කපා අලෙවියට තබා ඇති කරවලවල පුස් ඇති බැවින් පිළිබඳ මහජන සෞඛ්‍ය පරීක්ෂක ලවා පරීක්ෂා කිරීම සුදුසු බවත් පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් විසින් වර්තමාන සංවර්ධන වැඩසටහන් වන ගම්පෙරළිය හා එන්ටර්ප්‍රයිසස් ශ්‍රී ලංකා යන වැඩසටහන් පිළිබඳව ගරු සභාව දැනුවත් කර අතර, පක්ෂයක් ලෙස සියළු දෙනා එක්ව රටේ නායක දෙපළට හා සියළුම රජයට පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම සම්බන්ධව ස්තුතිවන්ත වන බවත් ප්‍රකාශ කරන ලදි.

**<u>ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා</u>**

● ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමළසිරි මැතිතුමා අදහස් දක්වමින් කසළ ට්‍රැක්ටරය නගරයේ යම් යම් අතුරු මාර්ගවල ගමන් කිරීමට නොහැකි බව පවසන මුත් සභාවක් ලෙස කසළ එකතු කිරීම ප්‍රතික්ෂේප නොකර, ට්‍රැක්ටරය යා නොහැකියි පවසන මාර්ගවල කසළ එකතු කිරීම සඳහා රෝද හතරේ සැහැල්ලු වාහනයක් යෙදවීම පිළිබඳ ගරු සභාවේ විශේෂ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

●එමෙන්ම පසුගිය වකවානුවේ ලහි ලහියේ පෙට්ටිගල මාර්ගය කාපට් කර අවසන් කලද මේ වන විට එහි අඩුපාඩු රාශියක් මතුව ඇති හෙයින් එහි පිළිසකර කිරීම් පිළිබදව හා බෝම්බුව ප්‍රදේශයේ අබලන් වූ මාර්ග ප්‍රිම්ක්ස් යොදා පිළිසකර කිරීම පිළිබඳ ගරු සභාවේ කඩිනම් අවධානය යොමුකරන ලෙස මෙහිදී වැඩිදුරටත් ඉල්ලා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා</u>**

● ගරු නාගරික මන්ත්‍රී ජයන්ත ප්‍රේමකුමාර මැතිතුමා විසින් අදහස් දක්වමින් සභාවෙන් ලක්ෂ 4ක් ලෙස ලද මන්ත්‍රී ප්‍රතිපාදන සඳහා ස්තුතිවන්ත වන අතර එම මුදල ලක්ෂ 8 දක්වා වැඩිකර දෙන මෙන් ඉල්ලා සිටින ලදි.

● එමෙන්ම සභා වාර්තාව මන්ත්‍රීවරුන් වෙත ලබාදීමේදි ඒ සමඟ ඉදිරි සභා වාරයේ න්‍යාය පත්‍රයට අදාළ අනෙකුත් වාර්තාද සභිකයන් වෙත ලැබීමට සලස්වන ලෙස මෙහිදී ඉල්ලා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා</u>**

●බලංගොඩ මූලික රෝහලේ පිවිසුම් මාර්ගයේ මුල් කොටස පමනක් පිළිසකර ඇති නමුත් ඉතිරි කොටස අබලන් තත්වයේ පවතින බැවින් එහි පවතින අවශ්‍යතාවය සලකා බලා සභා මුදල් යොදවා හෝ අවශ්‍ය පිලසකර කිරීම් සිදුකිරීම මහඟු සද් ක්‍රියාවක් පව බව පවසා සිටින ලදි.

**<u>ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමා</u>**

● මහජන පොළ ටෙන්ඩර්කරු පිළිබඳ චෝදනා මුඛයෙන් කථාකිරීම පිළීබඳ අප්‍රසාදය පලකර ගරු නාගරික මන්ත්‍රී රවීන්ද්‍ර කවිරත්න මැතිතුමන් විසින් බුදුදවස අංගුලිමාල කථාව හා ඉතිකුමාරියගේ කථාව අනුසාරයෙන් ඒ පිළිබඳ පැහැදලි කිරීමක් සිදු කල අතර සොරකමින් තොරව යහපත්ව ජීවත් වීමේ වටිනාකම පිලිීබද කරුණු පැහැදිලි කරන ලදි.

**<u>ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය</u>**

● දොරවෙළ ඔය හුණුකුඹුර මාර්ගයේ බෝක්කුව සුද්ධ කරදෙන මෙන් ගම්වැසියන් විසින් ඉල්ලීමක් කර ඇති අතර ඒ සම්බන්ධව නඩු නියෝගයක් පවා පවතින හෙයින් කඩිනමින් එම කටයුතු කර දෙන මෙන් ගරු නාගරික මන්ත්‍රිනි පී.චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉල්ලා සිටින ලදී.

**<u>ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමා</u>**

●ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් අදහස් දක්වමින් ලාම්පු තෙල් කඩල කරත්තවලින් නික්මෙන දුම නිසා හෝටල් වලට සිදුවෙන බලපෑම පිළිබඳව පවසා සිටි අතර ඒ සඳහා විසදුමක් ගැනීමේ අවශ්‍යතාවය පිළිබඳව පැහැදිලි කල අතර නගරයේ බොහොමයක් ස්ථානවල කාණු අධික ලෙස දුගද හමන බවත් කඩිනමින් පිරිසිදු කිරීමට අවශ්‍ය බවත් පවසා සිටින ලදී.

●කරවිකැටිය මාර්ගය සංවර්ධනය කර දෙන මෙන් කිහිප වරක් ඉල්ලීම් කලද මේවන තෙක් ඒ පිළීබද කිසිදු අවධානයක් යොමු නොවීම කනගාටුවට කරුණක් බවත් උඩකන්ද මාර්ගයේ කසළ ට්‍රැක්ටරය

නොයැම විශාල ගැටළුවක් වී ඇති බවත් ඒ සඳහා සුදුසු පියවරක් ගන්නා ලෙෂත් මෙහිදී ඉල්ලා සිටින ලදි.

●එමෙන්ම කම්කරු විනිශ්චය සභාව බලංගොඩට නැවත් ගෙන ඒමේ යෝජනාව ඉතා වැදගත් කරුණක් බව පවසා සිටි ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමන් විසින් කාර්පාක් භූමියේ රථගාල් හිමියන්ට අසාධාරණයක් වන පරිදි නීතිඥ්‍යවරුන්ට රථ ගාල් කිරීමට කිසිසේත්ම ඉඩ ලබාදිය නොහැකි බවත්, ඉතා අහිංසක මිනිසුන් පිරිසකගේ ජීවිකාවට ඉන් බලපෑමක් සිදුවන බවත් මෙහිදී බවසා සිටින ලදී.

<u>ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා</u>

● ගරු නාගරික මන්ත්‍රි නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් සභා ආරම්භයේදි ලක්ෂ 10 ක් ලබාදෙන බවට පැවසූ මන්ත්‍රි ප්‍රතිපාදන ලක්ෂ 4 දක්වා අඩුකලද ඉතිරි ලක්ෂ 6 එම කොට්ඨාශයේ සංවර්ධන කටයුතු සඳහා යොදවන බව පැවසූ අයුරින් එම කටයුතු කොට්ධාශයේ සංවර්ධනය උදෙසා ඉටුකර දෙන ලෙස පවසා සිටි අතර , ඉදිරියේදි ඩෙංගු වැඩසටහන් වැනි පරිසර හිතකාමි වැඩසටහන් නගර සභාව මගින් සිදු කිරීමේදි මන්ත්‍රිවරුන්ද දැනුවත් කරන මෙන් ඉල්ලා සිටින ලදී.එමෙන්ම නගර සීමාවේ පිරිසිදු කිරීම් කටයුතු නැවත අක්‍රමවත් වීමක් දක්නට ඇති හෙයින් ගරු සභාවේ අවධානය ඒ සදහා යොමු කරන මෙන් ඉල්ලා සිටින ලදී.

*<u>ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා</u>*

●ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් පැවසූ මහජන පොළ භූමිය අසළ ඇති බුදු මැදුර ඉදිරිපස කුකුල් මස් කඩය එම ස්ථානයෙන් ඉවත් කිරීමට සිදු කල යෝජනාව පිළිබද කරුණු දැක්වූ ගරු නාගරික මන්ත්‍රී වසන්ත පුෂ්පකුමාර ගුණරත්න මැතිතුමා කුකුල් මස් කඩය එම ස්ථානයේ ආරම්භ කල පසුව බුදු මැදුර ඉදිකල බැවින් සභාව අපහසුතාවයට පත්වන අයුරින් කථා නොකරන ලෙස පවසා සිටින ලදී.

●එමෙන්ම ගම් පෙරළිය වැඩසටහන පිළිබඳව සභාවේ දැක්වූ අදහස් පිළිබඳ කරුණු දැක්වූ ගරු නාගරික මන්ත්‍රී ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමන් නියම ගම්පෙරළිය සිදු වූයේ පසුගිය පළාත්

පාලන මැතිවරණයේදී බැවින් නැවත මැතිවරනයක් පැවැත්වුවහොත් ගම්පෙරලියක් සිදු කර පෙන්විය හැකි බව පවසා සිටින ලදී.එමෙන්ම ජනතාවට බදු ගැසීම උපරිම වී ඇති වකවානුවක බදුබරින් පීඩිත ජනතාව විශාල වශයෙන් අපහසුතාවයට ලක් වී ඇති බවත්,පසුගිය රජය වර්ෂ 9ක් පුරාවට සංවර්ධනය හා යුද්ධය යන දෙඅංශයම සිදු කරමින් ණය ලබාගත්තේ බිලියන 7400 පමණ වුවද මෙම රජය වර්ෂ 3 ක් වැනි කාලයක් තුළ බිලියන 7100 ක් පමණ ණය ලබාගෙන ඇති බවත් කරුණු පැහැදිලි කරන ලදී.

## 09. අවසානය

- බලංගොඩ ඩෙංගු අවම කළාපයක් බවට මේවන විට ප්‍රකාශයට පත්කල ඇති බවත්,නගරයේ සියළු රාජ්‍ය ආයතන එකතු වී ඩෙංගු මර්දන වැඩසටහන සාර්ථකව නිමාකල අතර ඩෙංගු රෝගය පිළිබඳව සම්පූර්ණ වගකිව යුත්තා නගර සභාව නොවන බවත් තම අවට පරිසරය පිරිසිදුව තබාගැනීම සැම මිනිසෙකුගේම වගකීමක් වන අතර වරිපනම් ගෙවන බව පවසා එහි වගකීම නගර සභාව වෙත පැවරීම වැරදි සහගත බවත් පවසා සිටින ලදී.එමෙන්ම කාණුවල ජලය රැදී සිටින ස්ථානවලින් දුර්ගන්ධයක් ඇතිවන අතර,කාණු පවිත්‍රතා කටයුතු මේවන විට සාර්ථකව සිදු කරගෙන යන බැවින් එම තත්වය ඉදිරියේදි පාලනය කලහැකි බව ගරු සභාපතිතුමන් විසින් පවසා සිටින ලදී.

  මෙම රජය යටතේ ණය කන්දකට යටවී තිබූ රටේ එම ණය කන්ද ක්ෂය කරමින් රට ගොඩනැගීමේ ජනතාවාදී වැඩපිළිවෙලක් ඉටුකර ගෙන යන බවත් එහි සාර්ථක පල නෙළා ගැනීමට සැමට ඉදිරියේ අවස්ථාවක් ලැබෙනු ඇති බවත් පවසා සිටි ගරු සභාපතිතුමන් වසින් ජනතා සුභසිද්ධිය උදෙසා අවංකව හැගීමෙන් ක්‍රියාකරන මෙන් සැමගෙන් ඉල්ලා සිටින බව පවසමින් ගරු සභාපතිතුමන් විසින් සභාවේ වැඩකටයුතු ප.ව. 3.00 ට පමණ අවසන් කරන ලදී.

චමික ජයමිණි විමලසේන,
සභාපති,
බළන්ගොඩ නගර සභාව.